Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

# ගැටුම් ශිෂ්ට සම්පන්න කිරීම : ගැටුම් ව්‍යාවර්තනය සඳහා අර්ථදායි සාම වාදය මෙහෙයුම් මතයක් වශයෙන්

ඩීටර් සෙන්ගාස් (Dieter Senghaas)

www.berghof-handbook.net



1. හැඳින්වීම 31

2. නව ජගත් රටාවක් 32

3. 20 වන සිය වර්ෂයේ සමාජ සහ දේශපාලන ව්‍යාවර්තනය 33

4. ගැටුම් සාමකාමීව හැසිරවීම සඳහා කොන්දේසි 34

5. අර්ථාන්විත ගැටුම් කළමනාකරණ සංස්කෘතියක අනභිමත වර්ධනය 37

6. සමාජ සහ දේශපාලන ව්‍යාවර්තනවලට විකල්ප ප්‍රතිචාර 39

7. ඵලදායි ගැටුම් කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සංස්කෘතියක් ගොඩනැගීම 41

8. සාම ප්‍රතිපත්තිය 44

9. සාමය සඳහා වූ ගෝලීය පද්ධතියක් 45

10. ගෝලීය සාම පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් 46

11. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම 47

©2006 Berghof Research Center for Constructive Conflict **Management**

# ගැටුම් ශිෂ්ට සම්පන්න කිරීම: ගැටුම් ව්‍යාවර්තනය සඳහා අර්ථදායී සාම වාදය මෙහෙයුම් මතයක් වශයෙන්

ඩීටර් සෙන්ගාස් (Dieter Senghaas)

## 1. හැඳින්වීම

සාමය නිර්මිත වී ඇත්තේ කෙසේ ද? කුමන ආකාරයෙන් ද? විසිවන ශත වර්ෂයේ පළමු දශක දෙක තුළ දී ප්‍රධාන පෙළේ සාමවාදියෙකු වූ ඇල්ෆ්‍රඩ් එච්. ෆ්‍රයිඩ් මෙම මූලික ප්‍රශ්නය සාමවාදී වැඩපිළිවෙලේ කේන්ද්‍රීය ස්ථානයේ තැබීය. මුඛ්‍ය පාඨය වූයේ *'හේතුකාරක සාම වාදයයි'.* "අපි කිසියම් ඵලයක් ඉවත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, පළමුව එය ඇති වූ හේතුව ඉවත් කළ යුතු වෙමු. ඒ වෙනුවට අලුත් සහ අප කැමැති ඵලයක් තැබීමට කැමැතිවන්නේ නම්, බලාපොරොත්තු වන ඵලය නිර්මාණය කිරීමට හැකියාවක් ඇති වෙනත් හේතුවක් ඒ වෙනුවෙන් ආදේශ කළ යුතු වෙමු" (ෆ්‍රයිඩ් 1918, 10). ක්‍රමවේදය වශයෙන් මෙය වියුක්ත බවක් හඟවන නමුත් ස්ථිර වශයෙන්ම විශේෂිත වූ දෙයක් ලෙස ඉදිරිපත් කර තිබේ: රාජ්‍යයන් අතර තිබෙන්නා වූ සම්බන්ධතා ගත් කල තවමත් පවතින ජාත්‍යන්තර අරාජකත්වයේ විපාකය යුද්ධය නම්, ඵලය වන යුද්ධය ඉවත් කිරීම සඳහා මෙම අරාජකත්වයම අහෝසි කළ යුතුය. තවද අරාජකත්වය වෙනුවට 'සමාජ විධි නියමයක්' හෙවත් සමාජය තුළ මානව සම්බන්ධතා ජාලාවක් ස්ථාපිත කළ යුතුවේ. එහි බලපෑම වන්නේ හිංසාකාරී නොවන විශ්වාසවන්ත ආකාරයෙන් පොදුවේ ගැටුම් කළමනාකරණයට අවකාශයක් ලබාදීමයි. වෙනත් වචනවලින්, එනම් පාඨයේ දේශපාලන අර්ථයෙන් ගතහොත් සාමය යනු නිර්මිතියකි.



හේතුකාරක හෙවත් හේතු/ඵල සාමවාදය ඒ අනුව මුල් බැස ඇත්තේ සාමය සඳහා වූ පූර්වාවශ්‍යතා සහ කොන්දේසි ගැන විධිමත්ව සිතා බලන්නා වූ ප්‍රයත්නයකය. විශ්ලේෂණාත්මක අර්ථයකින් ගත් කල, එය නූතන යුගයට ගැලපෙන්නා වූ සාම න්‍යායයක් වර්ධනය කිරීම සඳහා වර්තමාන ප්‍රයත්න හා සැසඳිය හැකි, මෙම න්‍යායයට අනුරූප වූ අර්ථදායී ගැටුම් කළමනාකරණ වැඩසටහනක් ද ඇතුළත් වූවකි (සෙන්ගාස් 1995, චෙම්පියල් 1998).

හුදෙක් සිය කැමැත්ත පරිදි එක් එක් කතුවරුන් මෙම විශේෂිත වූ පාඨය පාවිච්චි කළත් නොකළත්, සම්භාව්‍ය සාම වාදය පිළිබඳ විසංවාදයේ දී හේතු කාරක සාම වාදය ප්‍රධානතම ශාස්ත්‍රීය සහ සම්භාවිත වස්තු විෂය බවට පත්විය. විසිවන ශත වර්ෂයේ එක් විශාල ඛේදවාචකයක් වූයේ සාමවාදී ව්‍යාපාර තුළ මෙම සංකල්පය ජනප්‍රියභාවයෙන් පිරිහී ගොස් අවසානයේ දී නොවැදගත් බවට පත්වීමයි. ප්‍රචණ්ඩත්වය ඉස්මතු වී පෙනුණා වූ විසිවන ශත වර්ෂයේ දී යුද්ධය, සමූල ඝාතනය සහ ඒවා වැළැක්වීමේ හා යුද විරෝධී ව්‍යූහය තුළ විනාශ කිරීමේ අන්‍යෝන්‍ය තර්ජන (හොඳින් තේරුම්ගත හැකි හේතූන් මත) සාමවාදී න්‍යාය පත්‍රයේ ප්‍රමුඛ තැනක් ගෙන එහි චින්තනය සහ කාර්යයන් හැඩගස්වන තත්ත්වයකට පත්විය. එතෙකුදු වුවද එහි ඉතිරි වූ දෙයක් විය. එය නම් ස්ලෝවේනියානු සාම

පර්යේෂක විලැස්ට ජලුසික් වරක් විස්තර කළා වූ 'හිස් කුහරයයි': එනම් යුද විරෝධය තුළින් ආක්‍රමණය, භීෂණත්වය ප්‍රචණ්ඩත්වය සහ යුද්ධය, නිර්මාණය කරන ව්‍යුහයක් සහ මානසික තත්ත්වයන් බිඳ හෙළීමට අපේක්ෂා කරන අතර, ඊට ප්‍රතිපත්ති වශයෙන් එයට හාත්පසින්ම වෙනස්වෙමින් තිරසාර සාමය ප්‍රවර්ධනය කරන්නා වූ ව්‍යුහයන් සහ මානසික තත්ත්වයක් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වෙයි. කෙටියෙන් සඳහන් කරන්නේ නම් හේතුකාරක සාම වාදය සහ සමාන කළ හැකි ප්‍රවේශයන් ඒ අනුව "අර්ථදායී සාම වාදය" වශයෙන් ද විස්තර කළ හැකිය. එය සාමය ගොඩනැංවීමට සහ සැලසුම් කිරීමට සූදානමින් සිටින සාම වාදයකි.

## 2. නව ජගත් රටාවක්

හේතු කාරක සාම වාදයේ සම්භාව්‍ය ඉගැන්වීම් මගින් අපේක්ෂා කරනු ලැබුවේ ඇල්ෆ්‍රඩ් ෆ්‍රයිඩ් විසින් නිශ්චිත වශයෙන් විධිමත්ව සකස් කළ "නව ලෝක රටාවක්" (1918, 42) ස්ථාපනය කිරීමයි. මෙම අපේක්ෂාව මුල් බැස ගෙන තිබුණේ පරම්මරණ ධර්මය (eschatology) හා සම්බන්ධ අරමුණක් මත නොව කළමනාකරණය "සාරම්මණ ජීවයකින් ප්‍රබෝධමත්" (ප්‍රයිඩ්) කරගත හැකි ප්‍රවේශයන් තුළය. මෙම නව ජගත් රටාව නිර්වචනය කර ඇත්තේ "රාජ්‍ය සාමාජීකරණයේ" ප්‍රතිඵලයක් ලෙසයි. දැනටමත් ක්‍රියාත්මක ක්‍රියාවලියක් වන මෙය කුටප්‍රාප්ත වන්නේ රාජ්‍යයන් අතර ඇති කරගන්නා වූ "සමාජ ගිවිසුම" මගිනි. මෙය ගැටුම අහෝසි වන තත්ත්වයක් කරා නොව වර්තමාන පාරිභාෂිතය අනුව හඳුන්වනු ලබන ගැටුම් ව්‍යාවර්තනයක් කරා යයි. ගැටුම් ව්‍යාවර්තනය යනුː " ගැටුම්වල භීෂණාත්මක ගතිලක්ෂණ බැහැර කොට ඒවා මුළුමනින් ම නීත්‍යානුකූලව කළමනාකරණය කළ හැකි පරිදි ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රතිශෝධනය කිරීමයි" (ෆ්‍රයිඩ් 1918 : 12). මෙම ගැටුම් ව්‍යාවර්තනය හෙවත් "ගැටුමේ ස්වභාවය ව්‍යාවර්තනය" කිරීම - වර්තමාන සාම න්‍යාය සංවාදයේදී " ගැටුම් ශිෂ්ට සම්පන්න කිරීම" යන යෙදුමෙන් පැහැදිලිවම තේරුම් කරදෙන කාරණයයි (සෙන්ගාස් 1994 b; වොග්ට් 1996).

හේතු කාරක සාම වාදයේ එන සම්භාව්‍ය මතය අනුව රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් (අභ්‍යන්තර ගැටුම්) ශිෂ්ට සම්පන්න ආකාරයෙන් කළමනාකරණය කිරීම වැඩි හෝ අඩු ප්‍රමාණයකට සාක්ෂාත් කරගෙන ඇති බැව් උපකල්පනය කර ගෙන තිබේ. සාර්ථක "සාමාජීකරණයක්" දැනටමත් ක්‍රියාත්මක වී ඇති බව එයින් ගම්‍යමාන වෙයි. මෙම ප්‍රතිඥාව සමර්පිතයක් ලෙස තවදුරටත් සැලකිය යුතු නොවේ. එයට හේතුව වශයෙන් දැක්විය හැක්කේ ලෝකය වටා බලන්නෙකුට අද පැහැදිලි වන්නේ මේ අවස්ථාව වන විට රාජ්‍ය අතර, (අන්තර් රාජ්‍ය) තවදුරටත් ඇත්ත වශයෙන්ම යුද්ධ නොමැති තත්ත්වයක් පවතින බවයි. එනමුදු, ජාත්‍යන්තර ප්‍රජාව රාජ්‍යසමාජයක් බවට පත්වන තත්ත්වය තවමත් බොහෝ දුරස්ව පවතී. ඒ වෙනුවට රටවල් ඇතුළත (රාජ්‍යාභ්‍යන්තර) බොහෝ මිලිටරි ගැටුම් තිබේ. මූලික වශයෙන් ඒවා විවිධ ස්වරූප ගන්නා සිවිල් යුද ගැටුම්ය (ගැන්ට්සෙල් හා ස්වයිංහැමර් 1995). ඒ අනුව නව ලෝක ක්‍රමයක් සඳහා පමණක් නොව අභ්‍යන්තර සාමය සඳහා පහසුකම් සැලසීම පිණිස නැවත වරක් අර්ථදායී සාම විශ්ලේෂණය සඳහා මුඛ්‍ය විශ්ලේෂණාත්මක සහ ප්‍රායෝගික යොමුවක් අවශ්‍යව පවතී.

# 3. 20 වන ශත වර්ෂයේ සමාජ සහ දේශපාලන ව්‍යාවර්තනය

සාමයේ හේතු කාරක සහ අභ්‍යන්තර සාමය සඳහා හේතු වන තත්ත්වයන් ගැන පර්යේෂණ කිරීමේ දී පළමුවෙන්ම බටහිර රටවල ද වඩාත් මෑත දශකවල බටහිර නොවන රටවල ද සිදු වූ මූල විපර්යාසයන් ගැන සලකා බැලීම අවශ්‍ය වේ. දහනවවන ශත වර්ෂය අග සිට සහ විසිවන ශත වර්ෂයේ ආරම්භය දක්වා කාලයේ හේතු කාරක සාම වාදය පිළිබඳ සංකල්පය විධිමත්ව සකස් වන විට, ලෝකය විශේෂයෙන්ම වර්තමාන කාර්මීකරණය වී ඇති රටවල් වැඩි ප්‍රමාණයක් - සංවිධාන වශයෙන් ගත් කල ඒ වනවිටත් කෘෂිකාර්මිකව පැවතුණි. මෙම විෂයය ගැන ලියා ඇත්තේ අල්ප මාත්‍රයක් වුව ද, පසුගිය වසර සියය (1900-2000) ඉතිහාසයට එක්වන්නේ සාම්ප්‍රදායික කෘෂක ආර්ථිකයේ ලෝක ව්‍යාප්ත සෝදාපාළුවක් (කෘෂක හායනය) තිබූ ශත වර්ෂයක් වශයෙනි. අද බොහෝ ජනයා යැපුම් ආර්ථිකයන් තුළ ජීවත් නොවෙති. ඔවුන් ජීවත් වන්නේ වඩ වඩාත් ගෝලීය රාමුවක ලා ගිණිය යුතු, මුළුමනින්ම වාණිජකරණය වූ හෝ වෙළෙඳපොළ ආර්ථිකයන් තුළය. නැගෙනහිර ආසියාවේ සහ මධ්‍යම අප්‍රිකාවේ රටවල් මගින් පෙන්නුම් කෙරෙන පරිදි ඉතා පැහැදිලි වෙනස් අවස්ථා ඇතත්, සංවර්ධනය වන රටවල් මෙම ආර්ථික සංක්‍රාන්තියට විකල්ප නොවේ.

සාම්ප්‍රදායික වූ ගැමි පාදක ව්‍යුහයක පවත්නා කෘෂි කාර්මික ප්‍රජාවන්ගේ වෙනස්කම්වලට ප්‍රතිපක්ෂව මෙම සමාජ-ආර්ථික පරිසරය තුළ ජනතාවගේ බලාපොරොත්තුවල සීමා සහ ක්‍රියාකාරීත්වයට ඇති ඉඩකඩ ඉමහත් සේ පුළුල් වී ඇති බව පෙනේ. ව්‍යුහාත්මක වෙනස්වීම් හා සම්බන්ධ වී ඇති නාගරීකරණය ද සන්නිවේදනය තීව්‍ර කරයි; එමෙන්ම, ඉතිහාසයේ පළමු වරට පුළුල් ආකාරයෙන් ජනතාවට දේශපාලන වශයෙන් සංවිධානය වීමට ඉඩ සලසයි. ඒ අතරම, ඉමහත් සේ ව්‍යාප්ත වී ඇති සාක්ෂරතාව හේතු කොට ගෙන පුළුල් පදනමක් සහිත වූ හා අතිශයින් ඵලදායී වූ බුද්ධි සන්නිපාතයක් ඇති වී තිබේ: එනම්, වෙනත් වචනවලින් පවසන්නේ නම් ඒ හේතු කොට ගෙන බුද්ධිමය විමුක්තියක් සහ නිපුණතා විප්ලවයක් හට ගෙන ඇත. මිනිසුන්ගේ සාමාර්ථ්‍යතා හැකියාවන් මට්ටම විස්මයාවහ අන්දමින් වර්ධනය වෙමින් පවතී. ඒ අනුව පරිවර්තනයක් සිදුවෙමින් පවතී: " අවිද්‍යාවේ සිට ස්වයං-අවබෝධයකට හා එතැන් සිට ලෝකය සමග අන්තර් සම්බන්ධතා තත්ත්වයක් දක්වා" වශයෙන් කලකට පෙර ඉතාමත් උචිත අන්දමින් ප්‍රකාශ කරන ලද්දේ ඉන්දියානු සමාජයේ වරප්‍රසාද අඩු සමාජ පංති සමග වැඩ කළ කන්‍යා සොහොයුරියක විසිනි (ෆ්‍රැන්ක්ෆර්ටර් ඇල්ජ්මෙයින් සෙයිටුං 1.6, 1999). සාම්ප්‍රදායික සමාජවලට ප්‍රතිපක්ෂව, මෙය සමාජයේ ඉහළට නැගීම සඳහා අවස්ථා විවෘත කර දෙයි. තවදුරටත්, ගෝලීයකරණය කරන ලද මාධ්‍ය ඉඩකඩ ලබාදෙන්නේ බලාපොරොත්තු සහ ජීවන රටාවන් යන දෙකම ගෝලීය වශයෙන් සංසන්දනය කොට පැහැදිලි කරදීමටයි. ඇත්ත වශයෙන්ම, එවැනි සම්භාවිතාවන් හෝ නිරූපණ සැකසුම් සුචිත්‍රිත ආකාරයෙන් ගෝලීයකරණය කිරීම ආර්ථිකයන් හුදු ගෝලීයකරණයට ලක් කරනවාට වඩා බලපෑමක් ඇති කිරීමට ඉඩ ඇත.

එහි සඳහන් කළ පරිදි සාම්ප්‍රදායික සමාජ දේශපාලනමය වීමට ඉඩ ඇති අතර, ඇත්ත වශයෙන්ම ඒවා දේශපාලනීකරණය වූ සමාජ බවට විකාසනය වෙමින් පවතී. එහිලා සාම්ප්‍රදායික අනන්‍යතා අභියෝගවලට සහ ප්‍රශ්නවලට ලක්වෙයි. 'සත්‍යයන්' තවදුරටත් පරමභාෂිතයන් හැටියට

නිර්වචනය නොකළ හැකිය. අපසරණය වී ගිය යුක්තිය පිළිබඳ මත සහ රුචිකම් සීඝ්‍රයෙන් පැතිරෙයි. දේශපාලන රටාව නැවත හැඩගැස්වීම සහ අලුතින් නිර්වචනය කිරීම සඳහා ඇති ව්‍යාපෘතිවල බහුත්වතාව සලකා බලන කල 'යහපත් සමාජයක්' යන්න ගැටලුවක් බවට පත්වේ. සාන්ත අගෝස්තීනුගේ සහ සම්ප්‍රදායික සමාජවල යුරෝපියානු නොවන බොහෝ කතුවරුන්ගේ ලියකියවිලිවල එක් කාලයක විෂයක් වූ 'සමාජ රටාවේ නිසල බව' (tranquility of the social order) තවදුරටත් නිශ්චිතව දැක්විය නොහැකිය. මතුවෙමින් පවතින්නේ සමාජ ක්‍රමයේ නව ස්වරූපයන්ය. ඒවායේ ව්‍යූහ අනුව, ඒවා ගැටුම්වලට සහ සමහර විට ප්‍රචණ්ඩත්වය පවා ඇතිවීමේ භව්‍යතාවලින් ගහණව පවතී. ඒකාධිපති හෝ ආඥාදායක බලයකින් ඒවා මැඩ පැවැත්විය නොහැකි නම්, ඒවා තුළ පොදු හරයක් සෙවිය නොහැකි වනු ඇත. එසේ වුවත්, මෙම නව සමාජ ආර්ථික සහ සමාජ සංස්කෘතික තත්ත්වයන් යටතේ, ඒකාධිපතිවාදය සහ අඥාදායකත්වය පවා කෙටි කාලීන හා දීර්ඝකාලීන යන දෙයාකාරයෙන් ම අසාර්ථකත්වයට පත්වීම නිශ්චිත වේ. එයට හේතුව නම් සමාජ, සංස්කෘතික, සමාජ-ආර්ථික සහ ඒ නිසාවෙන් දේශපාලන බහුත්වතා තත්ත්වය බිඳහෙළිය නොහැකි වනු පමණක් නොව දේශපාලනීකරණය වූ අනන්‍යතා, සත්‍යයන්, යුක්තිය පිළිබඳ සංකල්ප සහ රුචිකම් ආපසු හැරවිය නොහැකිය. එසේ වන්නේ ඒවා සමාජමය වශයෙන් ගතික වූ සමාජවල පතුලෙන්ම මතුවන නිසාය. තවද මේ සියල්ලෙහි ප්‍රතිඵලය වන්නේ දැනට ලොව හැම දෙසින් ම අසන්නට ලැබෙන දේශපාලන සහභාගීත්වය සඳහා වන ඉල්ලුමයි.

සමාජ, ආර්ථික සහ සංස්කෘතික ගැටුම් දේශපාලන ගැටුම් ලෙස හඳුනාගත හැකි වන විට සහ දේශපාලන ගැටුම්, සමාජ, ආර්ථික සහ සංස්කෘතික ගැටුම් ලෙස හඳුනා ගත හැකි විට මූලික වශයෙන් දේශපාලනීකරණය වී හමාරය. එවිට අද බොහෝ සමාජවල තීව්‍ර ආකාරයෙන් මතුවන මුඛ්‍ය වූ කාරණය වන්නේ මූලික දේශපාලනීකරණය පැවතිය ද සහජීවනය පිළිගැනීමයි (සෙන්ගාස් 1998:2001). දිනක් දිනක් පාසා ලෝකය පුරා ඇතිවන දේශපාලන සිද්ධීන් අනුව සාමකාමී සහජීවනය වෙනුවට සීමාන්තික තත්ත්වයකදී අනුමාන කළ හැකි විකල්පය වනුයේ යුද්ධයයි.



## 4. ගැටුම් සාමකාමීව හැසිරවීම සඳහා කොන්දේසි

එහෙත් මෙම අවස්ථාවේ දී සිවිල් යුද්ධය වළක්වාගත හැක්කේ කෙසේද? අප දැනට ජීවත්වන ලෝකයේ මෙම ව්‍යාවර්තනය දහ අටවන ශත වර්ෂයේ මැද භාගයේ සිට, විශේෂයෙන්ම දහ නමවන ශත වර්ෂයේ දී, බටහිර යුරෝපයේ හටගත් කෘෂිකාර්මික සහ කාර්මික විප්ලවයන්හි මූලික ප්‍රතිඵලයකි. මෙය, එසේ නම් මෙහි කෙටියෙන් දක්වා ඇති කාරණය වන මූලික දේශපාලනීකරණය පවතිද්දීම සහජීවනය පවත්වා ගෙන යාම පළමුවෙන්ම තීව්‍ර වූයේ මේ අවස්ථාවේ දීය. ඒ හේතුවෙන් මෙම කාරණා ගැන ලත් අත්දැකීම් හා සංවාද තුළින් ලබා ඇති නිගමන සමහරක් බටහිර යුරෝපයෙන් ඉතා පහසුවෙන් ලබාගත හැකිය (සෙන්ගාස් 1994 b).

එසේ නම් නොවැළැක්විය හැකි ගැටුමක් ශිෂ්ට සම්පන්නව, එනම් ප්‍රචණ්ඩත්වයෙන් තොරව, නිරාකරණය කිරීමට අවශ්‍ය වන්නා වූ කොන්දේසි මොනවාද? යුරෝපීය අත්දැකීම්වල අනුසාරයෙන් පාදක කරුණු හයක් හඳුන්වා දිය හැකිය:

පළමු වැන්න රාජ්‍යය මගින් බලය යෙදවීමට ඇති නීත්‍යනුකූල ඒකාධිකාරියයි. එනම්, නීතියේ ආධිපත්‍යය පදනම් කරගෙන ප්‍රජාව ආරක්ෂා කර ගැනීමයි. එය ඕනෑම වත්මන් සාම විධිනියමයකටම අතිශය වැදගත් වන්නේය. අනන්‍යතා සහ රුචිකම් හේතු කොට ගෙන ඇති කරගන්නා වූ ගැටුම් ප්‍රචණ්ඩත්වයේ මාර්ගයෙන් බැහැර ව සංවාද තුළින් පවත්වාගෙන යාමට බල කළ හැකි එකම මාර්ගය පුරවැසියන් නිරායුධ කිරීමයි. මෙම කොන්දේසි ඉටු වී ඇති කල්හි පමණක් ගැටුමකට සම්බන්ධවීමට ඉඩ ඇති පාර්ශවයන්ට සාකච්ඡා මාර්ගයෙන් තම ගැටුම් නිරාකරණය කර ගැනීමට බල කළ හැකිය. ඒ මහජන වේදිකාවේ කෙරෙන සාකච්ඡා දේශපාලනය මගිනි. මෙම කොන්දේසියේ ඇති තීරක වැදගත්කම පැහැදිලි වන්නේ කොතැනක හෝ බල ඒකාධිකාරය කඩා වැටී පුරවැසියන් නැවත ආයුධ සන්නද්ධ වී ඒ සමගම එදිරිවාදිකම් සහ යුද නායකයන් නැවත මතුවන විට ය. වර්තමානයේ දී මෙය ලොව පුරා තිබෙන්නා වූ හමුදාමය ගැටුම්වල සාමාන්‍ය ලක්ෂණයකි.

දෙවනුව, එවැනි, බල ඒකාධිකාරයක් නීතියේ ආධිපත්‍යය යටතේ පාලනයක අවශ්‍යතාව නිර්මාණය කරන අතරම, එම තත්ත්වය සහතික කළ හැක්කේත් එයට පමණි. ඇත්ත වශයෙන්ම එය වර්තමාන ව්‍යවස්ථාදායක රාජ්‍යය මූර්තිමත් කරයි. මෙම පාලනය නොමැති වූ බලධිකාරිය හුදෙක් ඒකාධිපති පාලනයක අත්තනෝමතික හැසිරීම විස්තර කරන්නා වූ ආරූඪ නාමයක් වේ. දේශපාලන මතය හා අභිප්‍රාය හැඩ ගැස්වීම සඳහා මෙන්ම තීරණ ගැනීමේ ක්‍රියාවලි සහ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ද වන නීතියේ ආධිපත්‍යය "ක්‍රීඩාවේ නීතීන්" ද සපයයි. මූලික අයිතිවාසිකම් ලැයිස්තුවල දක්වා ඇති සාමාන්‍ය ප්‍රතිපත්ති හා එක පෙළට එන මෙම ක්‍රීඩා නියමයන් ද අත්‍යවශ්‍ය වන්නේ දේශපාලනීකරණය වූ සමාජ තුළ මුඛ්‍ය වූ කාරණා පිළිබඳව බරපතළ මතභේද පැවැතීමයි.



අභ්‍යන්තර සාමය සඳහා වන තුන්වන ප්‍රධාන කොන්දේසිය වන්නේ බලපෑම් පාලනය කිරීමයි. මෙය මතුවන්නේ නූතන සමාජවල ලක්ෂණයක් වන බහුවිධ අන්තර්-පරායත්තතාවල ප්‍රමාණය හා ධනය තුළිනි. එවැනි සමාජ බොහෝ සෙයින් විවිධ දිශාවන්හි පැතිරී ගොස් ඇති හෙයින් ඒවා තුළ ජීවත්වන ජනතාව අතිශයින් පුළුල් පරාසයකින් යුත් පක්ෂපාතීත්වයන් පෙන්නුම් කරන විවිධාකාර වූ භූමිකා රඟ දක්වති. ගැටුම් න්‍යාය සහ සැබෑ ජීවිත අත්දැකීම් පෙන්නුම් කරන්නේ අතිශයින් විවිධාකාර වූ සමාජ භූමිකාවන් ගැටුම විභින්න වී යාමට හේතුවන බවයි. ඒ හේතුවෙන් ගැටුමේ බරපතළකම අඩුවීමක් සහ බලපෑම් පාලනයක් ද ඇතිවේ. නවීකාරක සහ නූතන වැනි සංකීර්ණ සමාජ පරිසරයන් තුළ බලපෑම් පාලනයක් නොමැති වුවහොත් සාමකාමී සමාජ සම්බන්ධතා ගැන සිතීම පවා අසීරුය.

අනික් අතට බලන කල, හතර වෙනුව, ප්‍රජාතන්ත්‍රවාදී සහභාගිත්වය අවශ්‍ය වන්නේ නියත වශයෙන්ම බලපෑම් පාලනය අත්‍යවශ්‍ය බැවිනි. "නෛතික නොසන්සුන් බව" (legal unrest) සිග්මන් ෆ්‍රොයිඩ් යොදන යෙදුමකි. මෙම තත්ත්වය ඇතිවන්නේ ජනතාවට මහජන කටයුතුවලට සම්බන්ධවීමට නොහැකිවීමේ තත්ත්වයන් තිබීමෙනි. මේ තත්ත්වයන් වාර්ගික හෝ වෙනත් ආකාරයක අගති සහගත හේතූන් මත කෙරෙන වෙනස්කම් තුළින් මතු වේ. නරකම තත්ත්වය වන්නේ ගැටුමක් උත්සන්න වීමයි. දේශපාලනීකරණය වූ සමාජයන්හි මෙම තත්ත්වයන් ප්‍රචණ්ඩත්වයට තෝතැන්නක් බවට පත් විය හැකිය. එබැවින් නෛතික සංවර්ධනය සඳහා පදනම වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදය සුඛෝපභෝගී තත්ත්වයක් නොව ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීම සඳහා ඉවහල්වන අවශ්‍යතම පූර්ව කොන්දේසියකි.

පස් වෙනුව, කෙසේ වුවද, දේශපාලනීකරණය කරන ලද සමාජවල, ගැටුම් කළමනාකරණය සඳහා වූ මෙම ප්‍රවේශයට ස්ථිර භාවයක් ලැබෙන්නේ සමාජ යුක්තිය තහවුරු කිරීම සඳහා අඛණ්ඩ ප්‍රයත්නයන් ඇතොත් පමණි. නූතන ධනවාදී සමාජ පවත්වාගෙන යනු ලබන්නේ අතිමහත් වූ වෙළෙඳපොළ ආර්ථිකය පදනම් කරගෙන බැවින් සමාජ අසමානතාව නිරතුරුව ම පවතී. අසමානතාවේ ගතිකත්වය අකර්මණ්‍ය කිරීමට අඛණ්ඩව ප්‍රයත්න නොගන්නේ නම්, එවැනි සමාජ තුළ ගැඹුරු වූ සමාජ විවර වර්ධනය වීමට ඉඩ තිබේ. වරප්‍රසාද නොලත් පුද්ගලයන් හෝ කණ්ඩායම් මගින්, ක්‍රීඩාවේ නියමයන් තවදුරටත් සාධාරණ නොවන්නේය යන පදනම මත ව්‍යවස්ථානුකූල රාජ්‍යයේ විශ්වසනීයත්වය ප්‍රශ්න කිරීමට භාජනය නොකළ යුතු නම්, විභාජන යුක්තිය (distributive justice) දිගට ම පවත්වාගෙන යන ප්‍රයත්නයක් තිබිය යුතුය. එයට ප්‍රතිපක්ෂ තත්ත්වය වන්නේ සමාජ යුක්තිය සහ සාධාරණත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා ගනු ලබන අව්‍යාජ ප්‍රයත්න මගින් සාධනීය ගැටුම් කළමනාකරණයට හරයක් මෙන්ම මහජන ආයතනවලට නීත්‍යනුකූලභාවයක් ද ලබාදෙනු ඇත.

අනන්‍යතා දක්වාලීම සහ විවිධ රුචිකම් අතර සමතාවක් ඇති කර ගැනීමට මහජන කරළිය තුළ සාධාරණ අවස්ථා තිබේ නම්, මෙම ගැටුම් කළමනාකරණ ප්‍රවේශය විශ්වාසදායක අන්දමින් සමග්‍රහණය කරගෙන ඇති බවට උපකල්පනය කළ හැකිය: එමෙන්ම, අවශ්‍ය වන්නා වූ දරා සිටීමේ හැකියාව ඇතුළුව සමගි සම්මුති න්‍යාය පදනම් වූ ගැටුම් කළමනාකරණය සඳහා ඇති දක්ෂතාව දේශපාලන කාර්යයේ අවියෝජනීය අංගයක් බවට පත් වී තිබේ. බලයේ නීත්‍යනුකූල ඒකාධිකාරය, නීතියේ ආධිපත්‍යය සහ ප්‍රජාතන්ත්‍රවාදය කෙටියෙන් පවසන්නේ නම්, නූතන ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථානුකූල රාජ්‍යය, දේශපාලන සංස්කෘතියේ මුල් බැස ගෙන ඇත. ගැටුම් කළමනාකරණ සංස්කෘතිය ඒ අනුව ප්‍රජාවේ භාවාත්මක පදනම බවට පත් වේ. භෞතික පියවර (සමාජ සාධාරණය) ආයතනික ව්‍යුහය සහ ජනතාවගේ හැඟීම් (ජන මතය) ඇතිවන අර්ථදායී ප්‍රතිනාදය අතර වැදගත් සබඳකම් පිහිටුවීමක් හැටියට මතු වේ. අවසානයේදී වර්ධනය වන්නේ රැල්ෆ් ඩැන්රෙන්ඩෝෆ්ගේ යෙදුමක කියැවෙන 'බන්ධකයන්'ය. වෙනත් වචනවලින් පවසන්නේනම්, ගැඹුරටම මුල් බැස ගිය දේශපාලන සහ සංස්කෘතික බැමි සහ සමාජ-සංස්කෘතික පක්ෂපාතීකම්ය.



## 5. අර්ථදායී ගැටුම් කළමනාකරණ සංස්කෘතියක අනභිමතික වර්ධනය

අර්ථදායී ගැටුම් කළමනාකරණ දේශපාලන සංස්කෘතිය නූතන සහජීවනයක ආරම්භය සනිටුහන් කිරීමක් නොවේ. ඊට ප්‍රතිපක්ෂව එය ඓතිහාසික ක්‍රියාවලියට පසුව එක් වූවකි. එය ඉහතින් හඳුන්වාදී ඇති අනිකුත් පාදක කරුණු පහට සමාන වන නමුත් අතීතයේදී එයට යුරෝපයේ සාම්ප්‍රදායික, එනම්, පූර්ව- නූතන සංස්කෘතියේ පිළිගැනීමක් තිබුණේ නැත. එපමණක් නොව, වෙන් වෙන් වූ හැම පාදක කරුණකම ඉස්මතුවීම වඩාත් නිවැරදිව විස්තර කළ හැක්කේ 'අනභිමතික ක්‍රියාවලියක්' (reluctant process) වශයෙනි (Senghaas, 1998; 2001): මක්නිසාද යත්, අවිහරණය ඓතිහාසික වශයෙන් යුද පරාජයකින් මතුවන නියත ප්‍රතිඵලයකි. ශක්තිමතා දුර්වලයා පරදා ජයගනී. උත්කෘෂ්ටයා, නිකෘෂ්ටයා පරදා ජයගනී. නීතියේ ආධිපත්‍යය ආරම්භ වූයේ ඓතිහාසික වශයෙන් මත භේදයට තුඩු දුන් සමගි සම්මුති තුළිනි. ඒවා හැඩගස්වා සාදාගනු ලැබුවේ ගැටුම්වලට සම්බන්ධ පාර්ශවයන් බලෙන් නෙරපා බැවින් ඒවා ජනප්‍රිය නොවීම ස්වාභාවිකය. එසේ වුවද,

බිඳෙනසුලු බල සම්බන්ධතා පවතින අවස්ථාවලදී ඒවා ප්‍රධාන වශයෙන් සලකන ලද්දේ තාවකාලික සහන වශයෙනි. බලපෑම් පාලනයක් ගැන සලකා බලන කල, ස්වකීය ගතිකයන්ගෙන් සමන්විත ස්වයං ප්‍රඥාපනීය කාර්ය-පද්ධති හා සම්බන්ධ වනවාට වඩා සූක්ෂම සන්දර්භයන් තුළ පැහැදිලි නිර්වචනය වූ ස්වයං-තීරණ මත රැඳුනා වූ ජීවිතය වඩා යහපත් බව සලකන ලදී. අඩු වශයෙන් සිග්මන් ෆ්‍රොයිඩ්ගෙන් පසුව, මැතකදී පිළිගෙන ඇත්තේ බලපෑම් පාලනය හසුරුවනු ලබන්නේ තථ්‍යතා නියමයේ විධාන විසින් මිස තෘප්ති නියමයේ විධානවලින් නොවන බවයි: වෙනත් වචනවලින් පවසන්නේ නම්, සෑහෙන ප්‍රමාණයක ආවේදනීය උත්කර්ෂණයකින් තොරව එය ලබාගත නොහැකිය.

පුළුල් සහභාගීත්වය සඳහා වූ අරගලය ද සැමවිටම හටගත්තේ පැළපදියම් වූ විරුද්ධ පාර්ශවයට එරෙහිවය. අසමානතාව ජන්ම ලක්ෂණයක් වූ ලෝකයක, අපක්ෂපාතීත්වය සහ විභාජන සාධාරණත්වය සඳහා වූ අරගලයට ද එයම අදාළ වේ: සෑම අවස්ථාවකදීම, දේශපාලන සහභාගීත්වය සහ සාධාරණ විභාජනය, බලය භුක්ති විඳින්නන්ගෙන් බලයෙන් ලබාගත යුතුය. අවසාන වශයෙන් අර්ථදායී ගැටුම් කළමනාකරණ සංස්කෘතියක් ස්ථාපිත කිරීමට හැකිවන්නේ දෛවොපගත සිද්ධි සංඝටනාවක් වශයෙනි.: එනම්, ඉහත නිර්වචනය කරන ලද ආචාරශීලී බවේ හැම පාදක කරුණක්ම ඓතිහාසික සහ අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් කරන්නා වූ යථාර්ථයක් බවට පත් වූ විටය. එය අවසානයේදී ජනතාවගේ හැඟීම් තුළ ලැගුම් ගනී. මූලික දේශපාලනීකරණය මගින් පාලනය වන පරිසරයක් තුළ ගැටුම් පිළිබඳ ශිෂ්ටාචාරය සහ ඒ අනුව අවිහිංසාත්මක ගැටුම් කළමනාකරණය පිළිබඳ මූලික සිද්ධාන්තය මුල් බැස ගැනීමට ඉඩ ඇත්තේ මෙවන් අතිශය අනුරූප තත්ත්වයන් යටතේ පමණි.




එබැවින් මෙම ක්‍රියාවලියම බොහෝ ගැටුම්වල ඓතිහාසික ප්‍රතිඵලය ලෙස දැකිය යුතු වේ. යුරෝපීය සන්දර්භය අනුව එය සිදු වූයේ ඉහත සඳහන් ආකාරයෙන් පියවරින් පියවරටය. මෙහිදී මතුවන්නේ ගැටුම් කළමනාකරණයේ ආදර්ශයකි. එය නම් කරනු ලබන්නේ ශිෂ්ටාචාරාත්මක ෂඩශ්‍රය යනුවෙනි (Senghaas 1994 b; CallieB 1997). එයට ව්‍යවස්ථාදායක, ආයතනික සහ භෞතික මාන අයත් වනු හැරෙන්නට විදහාපාන තවත් ලක්ෂණ වන්නේ විශේෂිත මානසිකත්වයන් සහ වෙසෙසා දැක්විය යුතු ශිෂ්ට බවට පමුණුවන ක්‍රියාවලියක කෘත්‍රිම නිර්මිතියක් නියෝජනය කිරීමයි.

ඒත්තු ගැන්වීමට හැකිවන සේ තර්ක කිරීමට හැකිවන්නේ විමුක්තිය ලබා ඇති ජනතා සමාජවල මූලික දේශපාලනීකරණ ලක්ෂණ පෙන්නුම් කරන තත්ත්වයන් වන්නේ, පරම අයිතීන්, නිශ්චිත රුචිකම් කෙරේ එල්බී සිටීම, විශේෂිත වූ අනන්‍යතා අවධාරණය කිරීම, හිමිකාරක පුද්ගලාර්ථවාදය සහ පෙළඹවීම් මගින් කෙරෙන බලපෑම් එක්තරා ආකාරයකට 'ස්වභාවික' වන බවත් ඉවසීමේ හැකියාව, ක්‍රීඩාවේ නියමයන් පිළිබඳ අවබෝධයක් තිබීම, මැදහත්කම, බල වියෝජනය, එකඟතා සඳහා කැමැත්ත, සිය අභිලාෂයන් ඉක්මවා වෙනත් දේට ඇති සංවේදීතාව 'කෘත්‍රිම' බවත් ඒත්තු ගැන්ම සඳහා තර්ක කළ හැකිය: එය සුදුෂ්කර වූ සාමූහික ඉගෙනුම් ක්‍රියාවලිවල ප්‍රතිඵලයකි. විශේෂයෙන්ම යුරෝපයේ පුළුල් පදනමකින් යුත් මෙම සියලු ශිෂ්ටාචාරාත්මක ජයග්‍රහණ ලබාගෙන ඇත්තේ පැරණි දේශීය සහ යුරෝපීය වතු ආධිපත්‍යයක් සහිත සමාජ සම්ප්‍රදායන් සහ ඇත්ත වශයෙන්ම දහනව වන ශත වර්ෂයේදී මතු වූ නූතන පන්තිගත සමාජයට ආවේණික ගැටුම්වලට මුහුණදීමෙන් සහ එම ගැටුම්වල නියැලීමෙන්ය. ඒ අනුව අද පවතින ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථානුකූල රාජ්‍යය සංස්කෘතික හෝ ප්‍රවේණිය නැඹුරුවක

ප්‍රතිඵලයක් නොවේ. ඇත්තටම එය සහස්‍රක දෙක හමාරෙක් වූ යුරෝපීය ඉතිහාසයේ පසුගිය 150 වසර තුළ ඇති වූ නවීකරණ මාලාවක ප්‍රතිඵලයකි (සෙන්ගාස් 1998: 2001).

කොටුව 1 ශිෂ්ටාචාරාත්මක ෂඩශ්‍රය




## 6. සමාජ සහ දේශපාලන ව්‍යාවර්තනයට විකල්ප ප්‍රතිචාර

වේදනා විඳිමින් සහ වෙහෙස වෙමින් ද, තැත්-වරද ක්‍රමයෙන් ද, ඍජු මෙන්ම, වට රවුමේ යමින් හෝ සමහර විට මං මුළාවෙමින් ද යුරෝපයට ඉගෙන ගැනීමට සිදු වූ පාඩම වූයේ මුල දී තර්ජනයක් ලෙස පෙනී ගිය බහුත්වකරණය හමුවේ ඉවසීම විසඳුමක් වශයෙනි. මෙය විස්තර වශයෙන් නොවුවත් මූලධර්මයක් වශයෙන් ලෝකයේ වෙනත් රටවල් සම්බන්ධයෙන් ද නැවත නැවත පුනරුක්ත වනු ඇත. මෙහිදී ද සාම්ප්‍රදායික සමාජවලින් වශයෙන් ගතික සමාජ කරා සංක්‍රාන්තවීම හේතු කොට ගෙන මූලික දේශපාලනීකරණය පෙර කී පරිදි අතිබහුලවීමත් සමග සහජීවනය හා සම්බන්ධ ගැටලු ගැන වඩා හොඳ දැනුමක් ලබාගැනීම තවදුරටත් කල් දැමිය නොහැකි කාර්යභාරයකි. එසේ වුවද සම්ප්‍රදායික යුරෝපය මෙන්ම යුරෝපීය නොවන සම්ප්‍රදායික ප්‍රජා කණ්ඩායම්වල ගතානුගතික සංස්කෘතිය ඇතුළත මෙම නූතන ගැටලුවලට අනුරූප ප්‍රතිචාර නොමැත. මෙම ප්‍රජාවන්ගේ ස්වයං සංජානනය සාමාන්‍යයෙන් විශ්වකේන්ද්‍රීය විය: විශේෂයෙන්ම සම්භාව්‍ය වූ ජන පුරාණයේ, විශ්වය, සමාජය සහ එහි තුළ සිටින ජනයා ඒකීය වූවක් ලෙස සලකන ලදී. එය සුසංගත වූත්, සුසංවිහිත වූත්, අනුපරිපාටික වූත් ස්ථිතික වූත් නිර්මිතියකි. මෙම සංස්ථිතිය තුළ ක්‍රියාකාරීන්ගේ කාර්යභාරය පූර්ව නිශ්චිත වූවකි.

ඓතිහාසික ස්වයං සංජානනය ස්වභාවයෙන්ම චක්‍රීය විය; එබැවින් වර්තමාන අර්ථයෙන් ගත් කල සත්‍ය වශයෙන්ම ඓතිහාසික නොවේ. එයට හේතුව, මෙම චක්‍ර වර්ෂය පුරාම පවතින්නා වූ ස්වභාව ධර්මයේ කාල රටාව හෝ දේශපාලන ජීවිතයේ රිද්ම රටාව (අධිරාජ්‍යවාදී ව්‍යූහයන්ගේ හෙවත් අධිරාජ්‍යවල උදාව) පරිපාකයට යාම සහ හායනය මෙන් නිරන්තරයෙන්ම ආරම්භ කරන ලද ලක්ෂ්‍යයට ම ආපසු පැමිණේ. සාමාන්‍යයෙන් සත්‍යයේ බහුත්වතාව ඇදහිය නොහැකි විය. 'කේවල පරම සත්‍යය' එකක් වූ බැවිනි.

මෙම පාදක කරුණු යටතේ විශේෂයෙන් ම ප්‍රජා ආයතන සහ ආණ්ඩුව සංවිධිත ඒකකයක් වශයෙන් ගැනුණු හෙයින් සැලකුණේ කෘත්‍ය - සම්බාධක වශයෙනි. පැරණි චීනයේ සහ වෙනත් රටවල ගැටුම් සලකනු ලබන්නේ 'දෙව් ලොවින් පහත ඇති මහා ව්‍යාකූලත්වය' ලෙසයි. එබැවින් එය (ලුආන් නම් වූ) පවතින හෝ ඇතිවීමට ආසන්න වියවුලකි. ඒ අනුව ප්‍රතිලෝමක සිතිවිලි, වියවුල සමනය කිරීමට දායක වන්නක් ලෙස සලකන ලදී. එනම් වියවුල් කළමනාකරණ මූලෝපායක් වන එහි පරමාර්ථය වන්නේ 'විශ්වීය රටාව' යථා තත්ත්වයට පත් කිරීමයි. සහජීවනය සම්බන්ධ නූතන ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා මූලෝපාය වශයෙන් මෙම මත තවදුරටත් ප්‍රයෝජනවත් නොවේ. මේ හේතු කොට ගෙන මෙන් ම ලෝකයේ ඉතිරි කොටසේ උද්ගත වන තත්ත්වයන්හි බලපෑම නිසා, ගැටුම් කළමනාකරණය පිළිබඳ නව දෘෂ්ටිකෝණ සහ ඒ නිසාම නව යුගයට ගැලපෙන නව ප්‍රවේශ සහ අභ්‍යන්තර සාමය පිළිබඳ ආකෘති වර්ධනය විය යුතුය (සෙන්ගාස් 1998, 2001).

බටහිර වර්ධනය වන තත්ත්වයන් මෙන් නොව, ලෝකයේ යුරෝපීය නොවන රටවල සාමූහික ඉගෙනුම් ක්‍රියාවලි තීරණය වන්නේ හුදෙක් ස්ථානීය වශයෙන් සිදුවන රැඩිකල් වූ සමාජ සහ සංස්කෘති වෙනස්වීම්වලින් පමණක් නොවේ. ඒවා බටහිර ක්‍රියාත්මක වන තත්ත්වයන් මගින් ද හැඩගස්වනු ලැබේ. මෙම සන්දර්භය තුළ යුරෝපීය නොවන ලෝකයේ පවතින පැහැදිලි ප්‍රතිචාර හතරක් නිරීක්ෂණය කළ හැකිය:



පළමුවැන්න, නූතනත්වය හා බැඳුනා වූ අනුකාරක ප්‍රතිචාරයකි. එය බටහිර ලෝකයේ අභියෝග පිළිගන්නා අතරම, එහි අත්දැකීම් හා විසඳුම් ද පිළිගනී. තමන්ගේ ම සාම්ප්‍රදායික සංස්කෘතිය ඇතුළුව තමන්ටම බරක් ලෙස සැලකෙන සම්ප්‍රදායට එරෙහිව කෙරෙන අරගලවල දී බටහිර ලෝකය ආදර්ශයක් ලෙස සලකනු ලැබේ. විසිවන ශත වර්ෂයේ මුල් භාගයේ දී චීනය ඇතුළු බොහෝ ස්ථානවල එවැනි ප්‍රතිචාර දකගන්නට හැකි විය. එහෙත් එය කාලයේ අභියෝගයට මුහුණදිය නොහැකි විය. කෙසේ වුවද, නැගෙනහිර ආසියානු රටවල් හතර අතුරෙන් අලුතින් කාර්මීකරණය වෙමින් පවතින (NIC) කොරියාව හා තායිවානය සම්බන්ධයෙන් මෙම ප්‍රතිචාර අතිශයින් සාර්ථක බැව් ඔප්පු වෙමින් පවතී. මෙම නවක කාර්මික රටවල් 'නව ප්‍රජාතන්ත්‍රගාමී රටවල්' බවට විකාශනය වෙමින් පවතී; ඒවායේ දේශපාලන සංස්කෘතිය, මුළුමනින් දේශීය මුහුණුවරක් ගත්තද, නුදුරු අනාගතයේ දී ම බටහිර රටවලින් මූලික වශයෙන් වෙනස් නොවනු ඇත. නවීකරණයේ ප්‍රකම්පන ඇතිවන විට මෙන් ම සහජීවනයේ ගැටලු තීව්‍ර වන විට සම්ප්‍රදායේ උරුමක්කාරයෝ විවිධ වේශයෙන් මතු වී එතිඃ ගතානුගතිකයන්, ප්‍රතිගාමීන් සහ සංරක්ෂණවාදීන් වේශයෙනි. සාමාන්‍යයෙන් ඔවුන් හඳුන්වන්නේ ස්ථිති සංරක්ෂණවාදීන් වශයෙනි. ඉතිහාසයේ උද්ගාමී තරංගය ආපසු හැරවීමට සහ විශේෂයෙන්ම නවීකරණයේ ඉදිරි ගමන නැවැත්වීමට ඔවුහු උත්සාහ ගනිති.

බටහිරවාදී නූතනත්වය සාම්ප්‍රදායික ජීවන රටාවන් සමග ගැටෙන ඕනෑම තැනක දී මෙම දෙවන ප්‍රතිචාර විධිය ලෝකයේ සෑම තැනකදීම නිරීක්ෂණය කළ හැකිය. මෙම කාරණයේ දී උදාහරණයක් වශයෙන් ගාන්ධි දැක්විය හැකිය. හේතුව ඔහුගේ ජීවිත දර්ශනය ගැමි වාණිජත්වයට එරෙහි එමෙන් ම සමානාත්මතාව අගය කරන්නක් වීමයි. එය එකඟත්වය දැක්වූයේ කුඩා ඒකකවලට සහ කළමනාකරණය කරගත හැකි පාදක ව්‍යූහයන් ඇතුළත තිබෙන්නා වූ පොදු සම්මුති ලක්ෂණ පදනම් වූ ඍජු ප්‍රජාතන්ත්‍රවාදයටයි. අද විශේෂයෙන්ම මධ්‍යම අප්‍රිකාවේ මේ හා සමාන සංකල්ප දැකගත හැකිය.

තුන්වෙනුව, එවැනි ප්‍රකම්පන කොතැනක හෝ ඇතිවන විට, එතැන අර්ධ නූතනවාදීන් ද දැකගත හැකිය. බටහිර රටවල ශිල්ප ශාස්ත්‍රාදිය දැනගැනීමට උනන්දු වෙතත් ඔවුහු අනෙක් සියලු බුද්ධිමය ආභාසයන්ගෙන් සිය සමාජය ආවරණය කර ගැනීමට බලාපොරොත්තු වෙති. පසුගිය ශත වර්ෂයේ මැද භාගයේ සිට ජපානය මෙම ක්‍රියාමාර්ගය සාර්ථක අන්දමින් අනුගමනය කළේය. එහෙත් ප්‍රකටව පෙනෙන සමාජ වාදය අසාර්ථක විය. වඩාත් මෑතකදී "සිංගප්පූරු ගුරු කුලය" අර්ධ නූතනවාදයේ අනික් අය අභිබවා යන උදාහරණය බවට පත්ව තිබේ. තවත් උදාහරණයක් වන්නේ ඉස්ලාමීය මූලධර්මවාදයයි. කෙසේ වුවද, සිංගප්පූරුව, චීනය, බොහෝ ඉස්ලාමීය සමාජවල හෝ වෙනත් ස්ථානයක හෝ වේවා, අතිශයින් සංකීර්ණ වූ සහ බහුත්වවාදී සමාජයක දේශපාලන ප්‍රශ්න, නිරාකරණය කිරීමට හෝ එසේත් නැත්නම් පාලනය පිළිබඳ නිර්දේශාත්මක ලෙස ස්ථාපිත වූ වැඩසටහනක් තුළ විසඳුමකට සමීප කිරීම හෝ නොකළ හැකිය. ඉස්ලාමීය මූලධර්මවාදයේ මුල් බැස තිබෙන ධර්මායතනවාදී ප්‍රවේශයන් මත විශ්වාසය තබා ඇති ස්ථානවල කිසිසේත් මේවා නිරාකරණය කරගත නොහැකිය. පසුව දක්වන ලද එබඳු ප්‍රයත්නයන්ට (වර්තමානයේදී ඉරානයේ මෙන්) සමාන කළ හැකි වශීකරණසුලු අවස්ථා ඇතත්, ඒවා නූතනවාදයට එරෙහිව පවතින 'ධර්මායතවාදී ප්‍රතිවිප්ලවයේ' නිරර්ථක බව පැහැදිලි කරයි. මෙය යුරෝපයේදී ද, විශේෂයෙන්ම ප්‍රංශයේ දී ම ප්‍රංශ විප්වලයට ප්‍රතික්‍රියාවක් වශයෙන්, දහනව වන ශත වර්ෂයේ මුල් භාගයේ දී දැකගත හැකි විය. මෙවැනි ධර්මායතනවාදී වැඩසටහනක් තුළ බහුත්වවාදය ක්‍රියාත්මක කිරීමේදී එදා මෙන්ම අදත් සමාජ බැමි සිඳ බිඳ ලන, සාරධර්ම හා සංස්කෘතිය වනසා ලන, සදාචාරාත්මක අන්ධභාවයක් (ජහිලියියා) ප්‍රතිමූර්තියක් ලෙස සැලකේ. අනික් අතට බාධාවකින් තොරව ආගමික වශයෙන් මෙහෙයවනු ලබන බලය ක්‍රියාත්මක කිරීම නූතන අවස්ථාව සඳහා අත්‍යන්තයෙන් ම සුදුසු යැයි ඔවුහු සැලකූහ.

කෙසේ හෝ වේවා, අවසානයේ දී, යුරෝපීය නොවන ලෝකයේ නූතනවාදය සහ සම්ප්‍රදායන් ගැටී ප්‍රකම්පන උද්ගත වන විට නව ක්‍රියා මාර්ග අවශ්‍යවනු නිසැකය. යුරෝපය සම්බන්ධයෙන් මෙන් ම යුරෝපීය නොවන කලාපවල ද එබඳු වෙනස්කම් නිසැකයෙන් ම කලින් ප්‍රකාශ නොකළ හැකිය. එසේ වුවද යුරෝපයේ අත්දැකීම සමහර ස්ථානවල නැවත ක්‍රියාත්මක වීමට ඉඩ තිබේ. සාම්ප්‍රදායික වූ සංස්කෘතිය නවීකාරක ප්‍රවණතා සමඟ ගැටුණු වහාම සමාජයන් ව්‍යූහාත්මක සහ ඒ හේතු කොටගෙන මානසික වෙනස්වීමකට ද භාජනය වූ විට මෙම සංස්කෘතීන් අනිවාර්යයෙන් ම එකිනෙක අතර ගැටුම්වලට එළඹෙයි. මෙය අවශ්‍ය වූ සාමූහික ඉගෙනීමේ ක්‍රියාවලි උද්ගත කරන අතර, මේ හේතුවෙන් ගැටලු සහගත වූත් සහ අප්‍රසන්න වූත් වර්ධනයන් ඉස්මතු විය හැකිය.

*ඉතිහාසයේ අවසානය* (ෆුකුයාමා 1922) නම් කෘතියේ සඳහන් න්‍යායය පරිදි නූතනවාදයේ සියලු නවීකරණ බටහිර/ යුරෝපීය රටවල ඉතා ගැඹුරින් සාක්ෂාත් කරගෙන ඇතත්, සහජීවනය පිළිබඳ ප්‍රශ්න සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ දී යුරෝපීය නොවන රටවල් විසින් ඉදිරිපත් කළ හැකි අවශේෂ වූ දෙයක් නොමැත. කෙසේ වුවද එම න්‍යායයට පටහැනි වශයෙන්, මානව සංහතියේ පහෙන් හතරක් ඉදිරි දශකවල දී නැවත වරක්, සාමාන්‍යයෙන් ඔවුන්ගේ කැමැත්තට විරුද්ධව යමින්, සමාජ ගතිකත්වයේ සහ මූලික දේශපාලනීකරණයේ ප්‍රශ්නවලට සුදුසු විසඳුම් දේශීය වශයෙන් සොයාගැනීම සඳහා අත්හදා බැලීම් කරනු ඇත. සිය වටිනාකම අවසානයේ දී ඔප්පු කර පෙන්වන ආකාරයේ විසඳුම් සැලසුම් පුවරුවේ වියුක්ත සංකල්ප තත්ත්වයේ නිර්මාණය වීමට ඉඩක් නොමැත. මෙම සන්දර්භය තුළ බොහෝ දුරට විය හැක්කේ යුරෝපීය අත්දැකීම පුනරුක්ත වීමකි: සහජීවනය සඳහා වන වැඩපිළිවෙල සහ තිරසාර ගැටුම් කළමනාකරණය, වෙනත් වචනවලින් පවසන්නේ නම් අභ්‍යන්තර සාමය දීර්ඝකාලීන පදනමක් යටතේ අවසානයේ දී සත්‍ය බව ඔප්පු කර තිබෙන දේශපාලන ගැටුම්වල අනපේක්ෂිත ප්‍රතිඵලය වශයෙන් වර්ධනය වීමට ඉඩ තිබේ.

ඒ අනුව යුරෝපයේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාදායක රාජ්‍ය, ඒවායේ ආයතන සහ ප්‍රජා ආකල්ප වෙත ගිය වෙහෙසකර වූත්, වේදනා සහගත සහ ගැටුම්වලින් ගහණ ගමනට හා සමාන ඉරණමකින් යුරෝපීය නොවන රාජ්‍යයන්ට ගැලපීමට ඉඩක් නැත. එම ක්‍රියාවලිය යුරෝපීය අත්දැකීම සහ සමාන වනු ඇත. විශේෂයෙන් ම අව්‍යාජ නවීකරණ ඇතිවන්නේ නම් සමහර විට ප්‍රතිඵල වෙනස්වන්නට ඉඩ තිබේ. කෙසේ වුවද, මෙහි පසුව සඳහන් තත්ත්වයේ ප්‍රතිඵල තුළ එන කාරණයේදී විශේෂයෙන්ම, සම්ප්‍රදායානුකූල සංස්කෘතියේ විචක්ෂණාත්මක මාන පිළිබිඹු නොවනු ඇත. එහෙත් තමන්ගේම සම්ප්‍රදායන්ට එරෙහි වූ නව්‍ය ලක්ෂණ එහි පිළිබිඹු වන්නට ඉඩ තිබේ.



ගෝලීය මට්ටමෙන් නිරීක්ෂණය කරන කල්හි විසි එක්වන ශත වර්ෂයේ දී මානව සංහතියට මුහුණපාන්නට සිදුවන ප්‍රබල අභියෝගයන්ගෙන් එකක් වන්නේ ඉවසීමේ හැකියාව පිළිබඳ රටාවන් තුළ බහුත්වකරණයට විසඳුම සෙවීමයි. ආයතනික තලයේ දී නිරුපද්‍රිතව තබා ගත යුතු මෙම ඉවසිලිවන්ත භාවය ජනතාවගේ හැඟීම් තුළ මුල් බැසගෙන ඇත. මෙම අභියෝගය උත්සන්න වෙමින් පවතින ලෝක-ව්‍යාප්ත පාරිසරික ගැටලුවලට වඩා ලඝු බවක් නොවේ. විසිවන ශත වර්ෂය දෙස ආපසු හැරී බලන කල පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයේ ඇති බැරෑරුම් බවයි. එම ශත වර්ෂය තුළදී ඉවසිලිවන්ත භාවය වෙනුවට වෙනත් 'විකල්ප' ගණනාවක් ම්ලේච්ඡ සහ කුරිරු අන්දමින් පරීක්ෂා කර බලන ලදී: ඒවා නම් විවිධාකාර වූ, වර්ජනය කිරීම්, මුඩුක්කු ගත කිරීම, වර්ණ භේදය, වර්ග භේදය, කුල භේදය වැනි භේද, නෙරපා හැරීම, ජන වර්ග අතුගා දැමීම හෙවත් ජන සංහාරය සහ සිවිල් යුද්ධ ආදියයි (ඩබාග් සහ ප්ලට් 1998; හෙයින්සොන් 1998).

විසිවන ශත වර්ෂය ආරම්භයේ දී තිබුණ හේතු කාරක සාම වාදයට ප්‍රතිපක්ෂ වශයෙන් බහුත්වකරණයේ අවිපරීත බව යන්නෙන් අදහස් වන්නේ, සමාජ ඇතුළත නෛතික, ආයතනික, භෞතික සහ මනෝ විද්‍යාත්මක සහජීවන ක්‍රමයක් සොයායෑම න්‍යාය පත්‍රයේ ඉහළින්ම තිබෙන බවයි. අභ්‍යන්තර සාමය ළඟා කර ගැනීම සඳහා ඇති අවශ්‍යතාව ඒ අනුව පරිධිය ගැටලුවක් නොවේ; අද වෙන කවරදාටත් වඩා එය තීව්‍ර, ජීවිත හානි ඇති කළ හැකි, ගෝලීය ප්‍රශ්නයකි. ලෝකයේ අස්සක් මුල්ලක්

නැ.ර, සම්ප්‍රදායානුකූල සහ ගතානුගතික සමාජ ව්‍යූහයන් පිරිහෙමින් පවතී. ඒ හේතු කොට ගෙන, නව සමාජ සහ දේශපාලන ව්‍යූහයන් ගවේෂණය මගින් පොළඹවන ලද රැවිකම් සහ හැඩගැසුම් පිළිබඳ ගැටුම්, බල අරගල සහ සංස්කෘතික විසංවාද ඇතිවීම නොවැළැක්විය හැකිය.

## 7. අර්ථදායී ගැටුම් කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර සංස්කෘතියක් ගොඩනැංවීම

එක් එක් සමාජ ඇතුළත පවා දුෂ්කර කාර්යයක් සේ සැලකෙන, එමෙන් ම ඉතා යහපත් තත්ත්වයන් යටතේ වුවද ස්ථිරභාවයක් තහවුරු කළ නොහැකි, දුර්වල ජයග්‍රහණයක් වශයෙන් පමණක් සැලකිය හැකි, අභ්‍යන්තර සාමයේ සංචල ස්ථාවරත්වය ජාත්‍යන්තර තලයේ දී වඩාත් දුෂ්කර බව පෙනේ. එම අභ්‍යන්තර සාමය යනු ජාත්‍යන්තර සහජීවනය සාක්ෂාත් කර ගැනීම සහ ආරක්ෂා කර ගැනීමයි (ෆෝල්ක් 1995; ෆෙරෙන්ස් 1994). බලය යෙදවීම ගැන මූලික තහනමක් 1945 සිට එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ ජාත්‍යන්තර නීතිය යටතේ සඳහන්ව තිබුණේ වී නමුත් රාජ්‍යයන් තවමත් අවි හරණය කර නැත: එක්සත් ජාතීන්ගේ සාමූහික ආරක්ෂාව පිළිබඳ ක්‍රම පද්ධතියේ නියමය පරිදි බලය පාවිච්චි කිරීමේ ඒකාධිකාරයක් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය සතුව පවතී: එසේ වුවද, එය ගැටලු සහගත බව පිළිගත යුතු වේ. 'ජාත්‍යන්තර තලයේදී නීතියේ ආධිපත්‍යය මගින් පාලනය කිරීම' යන්නෙන් හඟවන්නේ කුමක්ද යන ප්‍රශ්නය මෑත වර්ෂවලදී සාකච්ඡා කිරීම ආරම්භ වූවා පමණි (බව්වර් 1966; ගැඩිං 1996; ලයිලැච් 1998). උදාහරණයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය අනුව බලය පිළිබඳ මෙම අර්ධ ඒකාධිකාරය පැවරී ඇති ආරක්ෂක මණ්ඩලය සතු බලය ජාත්‍යන්තර තලයේදී ක්‍රියාත්මක කිරීමට බලතල ඇත්ත වශයෙන් ම ලබාදී ඇත්තේ කාටද? ආරක්ෂක මණ්ඩල තීරණ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස සලකන අතෘප්තියට පත් පාර්ශව ආරක්ෂක මණ්ඩල තීරණවලට එරෙහිව කරන පැමිණිලි ගැන ක්‍රියා කිරීමට බලය පැවරී ඇති අධිකාරිය කුමක් ද? (බෙඩ්ජාඕයි 1995; ෆොල්ක් 1993; හොෆෙ 1999; මාර්ටෙන්සුක් 1996; සර්න් සහ සැන්ගල් 1999).

ඒ හැරෙන්නට ජාත්‍යන්තරකරණය, අන්තර්ජාතිකකරණය හෝ දැනට භාවිතයේ විලාසිතාවක් වී ඇති ගෝලීයකරණය ආදියේ කැපී පෙනෙන ක්‍රියාවලි දැනට ක්‍රියාත්මක වන බව සත්‍යයකි (බීෂීම්, ආදී... 1999) කෙසේ වුවද, මෙම ක්‍රියාවලි සිදුවෙමින් පවතින්නේ තවමත් ඉතාමත් දැඩි වශයෙන් බෙදී ඇති ලෝකයක යි. මෙයින් ගම්‍ය වන්නේ බලපෑම් පාලනය කිරීම සම්බන්ධයෙන් ඇති ක්‍රම-බද්ධ (ගෝලීය වශයෙන් ඵලදායී) බාධකයන් ඇත්තේ සුළු ප්‍රමාණයක් බවයි (සෙන්හාස් 1994 a). ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහ වැනි ශිල්පීය/ කාර්ය බද්ධ ක්ෂේත්‍රයන්හි පමණක් ජාත්‍යන්තරව පිළිගත් නීතිරීති බල පැවැත්වෙයි. කොටස් වෙළෙඳපොළවල් පිළිබඳ මානසිකත්වය දේශජකරණය පෙරදැරි කරගත් ජාත්‍යන්තර මූල්‍ය ගනුදෙනු සඳහා ඒ හා සමාන නීතිරීති තිබුණහොත් තත්ත්වය කෙසේදැයි කල්පනා කර බලන්න. ජාත්‍යන්තර තලයේදී ප්‍රජාතන්ත්‍රවාදී සහභාගීත්වයෙන් අත්පත් වන්නේ මොනවාද? දැනටමත් ඒ ආකාරයෙන් ක්‍රියා කරනු ලබන රාජ්‍යයන් හැරුණු විට, ජාත්‍යන්තර තලයේදී සංවිධාන විය යුත්තේ කවුරුන්ද? ප්‍රජාතන්ත්‍රවාදී අවශ්‍යතා සපුරා ගැන්මට සහ ප්‍රචණ්ඩාකාරී ගැටුම් වැළැක්වීමට ඔවුන් කටයුතු කළ යුත්තේ කුමන ආකාරයෙන්ද? ආණ්ඩු සමඟ ලාභාපේක්ෂක කණ්ඩායම් නියෝජනය වන්නේද? සේවාදායක සහ සේවා සංවිධාන රාජ්‍යයන් සමග ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නියෝජනයක් ලබනවාද?

නැතිනම් ඇත්ත වශයෙන්ම විවිධ වර්ගවල සහ විවිධ ප්‍රමාණයන්ගෙන් යුත් වෘත්තීය වෙදීන්ගේ සංවිධාන, සංස්කෘතික සහ ආගමික ප්‍රජාවන් මෙන්ම බහුජාතික සමාගම් නියෝජනයක් ලබනවා ද? නිතර උපුටා දක්වන 'සිවිල් සමාජය' යන ඒකකයේ තත්ත්වය කුමක් ද? එමෙන්ම හරිත සාම කණ්ඩායම (ග්‍රීන් පීස්) ක්ෂමා ජාත්‍යන්තරය (ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්) වැනි රාජ්‍ය නොවන සංවිධානවල තත්ත්වය කෙසේ ද? ඔවුන් විසින් ලබා ඇති පැවරුම්වල පදනම කුමක් ද? ඇත්ත වශයෙන්ම ජාත්‍යන්තර තලයේ දී නියෝජනාත්මක ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාවක් කුමනාකාරයක් ගත යුතු ද? මෙම සන්දර්භයේ දී 'පුරවැසි සහභාගිත්වය' යන්නෙහි අර්ථය කුමක් ද? (ආර්චිමුගි හා හෙල්ඩ්, 1995; හෙල්ඩ් 1995; හොෆ් 1999) ප්‍රශ්නයකින් පසු තවත් ප්‍රශ්නයක් පැන නගී. ක්‍රමයෙන් ඉස්මතු වී ගෙන එන, "පශ්චාත් - ජාතිකත්ව සංවිධානය" වැන්නක් (හැබමාස් 1998; සර්න් 1998) සඳහා විසි එක්වන ශත වර්ෂයේදී විසඳුමක් සොයාගත යුතුය.

වෙනත් ආකාරවලින් ගත් කල උපකල්පනය කළ හැක්කේ ජාත්‍යන්තර තලයේ දී පවා අසමානතා ඉවත් කිරීමට ප්‍රයත්නයන් නොගන්නේ නම්, අවම වශයෙන් සාධාරණ විභාජනයක් සඳහා ක්‍රියා කිරීමට කටයුතු නොකරන්නේ නම් ගැටුම ශිෂ්ට සම්පන්න තත්ත්වයකට ගෙන ඒමේ අවස්ථා අඩු බවය. වගකීමකින් යුත් සහ සාරම්මණ ප්‍රයත්න ගන්නේ නම් පමණක්, වරප්‍රසාදය සහ අසාධාරණය යන ගතිකයන් මගින් ජනනය කරන ලද, අවසානයේදී පාලනය කරගත නොහැකි දේශපාලන බලය එක්තරා අන්දමකට පුපුරා යාම වැළැක්වීමට හැකිවන්නේය. ප්‍රමාණවත් තරමින් උදව් ලබමින් නිර්මාණාත්මක ගැටුම් කළමනාකරණ සංස්කෘතියකට ජාත්‍යන්තර තලයේ දී අවස්ථාවක් ලැබෙන්නේ එවිට පමණකි.



## 8. සාම ප්‍රතිපත්තිය

අභ්‍යන්තර සාමය සම්බන්ධයෙන් වූ අත්දැකීම් සහ ජාත්‍යන්තර සාමය සඳහා වන අවශ්‍යතා සහ ගැලපෙන්නා වූ විධිනියමයක් පිළිබඳව අප පරීක්ෂා කර බැලුවහොත්, විශ්වාසය තැබිය හැකි සහ ශිෂ්ට සම්පන්න ගැටුම් කළමනාකරණය හෝ කල්පවතින සාමය සම්බන්ධයෙන් ප්‍රකාශ කළ හැක්කේ කල්පවතින සහ තිරසාර වශයෙන් නිර්වචනය කර ඇති සාමය දෙස බැලිය යුත්තේ බලය යෙදවීම වැළැක්වීම සඳහා යොමු කෙරෙන ප්‍රචණ්ඩ නොවන දේශපාලන ක්‍රියාවලියක් ලෙසයි. මෙම ක්‍රියාවලිය මාර්ගයෙන් සමාජ කණ්ඩායම් අතර හෝ රාජ්‍ය සහ ජාතීන් අතර සාමකාමී සම්බන්ධතා ස්ථාපනය කිරීමට හැකිවන පරිදි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ගිවිසුම් හා සමගි සම්මුති ප්‍රයෝජනයට ගත යුතුය. මෙහි දී මෙම සමාජ කණ්ඩායම්වල රාජ්‍යයන්ගේ සහ ජාතීන්ගේ පැවැත්ම අන්තරායකට පත් නොකළ යුතුය. සියලු සාමකාමී පිළියම් අවසන් වූ පසු ප්‍රචණ්ඩත්වයට අනුගත වීම අවශ්‍ය යැයි සිතෙන පරිදි පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල යුක්තිය හෝ අයිතීන් පිළිබඳ සංජානනය දැඩි ආකාරයෙන් උල්ලංඝනය නොවන පරිදි කටයුතු කළ යුතුය. මේ ආකාරයෙන් සැලසුම් කෙරුණු සාම ප්‍රතිපත්තිය තේරුම් ගත හැකිවන්නේ වර්තමාන ලෝකයේ මූලධර්මවාදී දේශපාලනීකරණයේ ප්‍රතිඵලය වන දේශපාලන භීෂණත්වය සමග කටයුතු කිරීම සඳහා අත්‍යවශ්‍ය, අඛණ්ඩ සහ අර්ථදායී ක්‍රියාවක් වශයෙනි.

## 9. සාමය සඳහා වූ ගෝලීය පද්ධතියක්

සාම ප්‍රතිපත්තිය කුඩා රණ බිමක, එනම්, ජනසමාජ සහ රාජ්‍යයන් ඇතුළත වුවද සාර්ථක වන්නට නම්, අදාළ තත්ත්වයන් හිතකර විය යුතුම ය. ඇත්ත වශයෙන් ම, අහිතකර තත්ත්වයන් යටතේ බොහෝ විට ප්‍රචණ්ඩ නොවන ගැටුම් නිරාකරණය ප්‍රචණ්ඩත්වය දක්වා යොමුවෙයි. එසේ වුවද, පෙර දී මතු වූ ප්‍රශ්නවලින් හඟවන පරිදි නව ගෝලීය රටාවක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ගෝලීය තලයෙන් අවශ්‍ය වන පූර්වාවශ්‍යතාවන් විෂය පථය අනුව වඩාත් පුළුල් වන්නේ මෙහි පවතින්නා වූ තත්ත්වයන්හි යෝග්‍යතාව ඉතා පහත් මට්ටමක පවතින බැවිනි (රිට්බර්ගර්, 1994).

විසිවන ශත වර්ෂයේ මුල භාගයේ සිටි සාමවාදීන් සාමය සඳහා අර්ථදායී සංකල්ප සකස් කිරීමට උත්සාහ කළේ ජාත්‍යන්තර තත්ත්වයන් කල්පනාවට ගනිමිනි; ඔවුහු හිතට එකඟව ලෝක සාම රටාවක් සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වූහ. මේ අවධියේදී එයට 'ගෝලීය පාලනය' යයි අපට කිව හැකිය. එයින් පිළිබිඹු වන්නේ බොහෝ සේ පැරණි සහ ඉතාමත් අලුත් ගෝලීය අන්‍යොන්‍ය පරායත්තතා තත්ත්වයන්ය. එසේ වුව ද, එවැනි රටාවක් නියමාකාරයෙන් ක්‍රියාත්මකවීම සඳහා ප්‍රාදේශීය හෝ මහාද්වීපික කලාප අවශ්‍ය බව තේරුම් ගැනීමට තරම් ඔවුහු යථාර්ථවාදී වූහ.

ප්‍රාදේශීය තලයේ දී පවා දේශපාලන ප්‍රජා ගොඩනැගුම අසීරු සාමූහික ඉගෙනුම් ක්‍රියාවලියකි. මෙය විශේෂයෙන් ම පැහැදිලි කර දෙන්නේ යුරෝපීය අනුකලන අත්දැකීම් තුළිනි. මෙම අනුකලන ක්‍රියාවලියට හවුලේ පරිහරණය කළ හැකි මූලික අගයන් කිහිපයක්, දියුණු කරන ලද සන්නිවේදන පද්ධතීන්, සියලු පාර්ශවයන්ට ප්‍රයෝජනවත්වන සාධාරණ හුවමාරු ක්‍රමයක් සහ ඒ සියල්ලටම වඩා අනුකලන ක්‍රියාවලියට සම්බන්ධ දුර්වල සහභාගීවන්නන්ගේ අවශ්‍යතා සහ ඕනෑකම්වලට ප්‍රතිචාරයක් තිබිය යුතුය. කෙසේ වුවද මුලදී යුරෝපීය සන්දර්භය පිළිබඳව පමණක් වුවද එවන් අනුකලන ක්‍රියාවලියක් ප්‍රාදේශීය තලයේ දී සාර්ථක විය යුත්තේ, ජාතික රාජ්‍යයෙන් ඔබ්බට යන තිරසාර සාම රටාවක් යනු මිරිඟුවක් නොවන බවට මෙය පමණක් වුව සාක්ෂ්‍ය වන බැවිනි; කාන්ට්ගේ යෙදුම වන 'සංස්ථාපිතයි' (constituted) යන්න සාම-රටාව සඳහා යෙදූ විට එය විශ්වාසදායක පදනම් මත ව්‍යවස්ථානුකූල, ආයතනික, භෞතික සහ හැඟීම් බර ප්‍රයත්නයන් තුළින් ස්ථිරත්වයක් ලබතියි බලාපොරොත්තු තබාගත හැකිය (සෙන්ගාස් 1992; ඩොයිෂ් ආදී... 1957; සීලින්ස්ක් 1995).

ගෝලීය පාලනයක් ස්ථාපිත කිරීමට ගනු ලබන ප්‍රයත්නයේදී ඉලක්කය වන්නේ, හේතු කාරක සාම වාදය පිළිබඳ මතය ඉදිරිපත් කරන අය විසින් පැහැදිලිව හඳුන්වා දී ඇති පරිදි ලෝක සාම රටාවක් සඳහා නිර්මිතියක් සහ අභ්‍යන්තර ජීවයක් නිර්මාණය කිරීමයි: පහළ තලයේ සාමකාමී ඒකල රාජ්‍යයේ සිට (අපූරු පූර්ව අවශ්‍යතාවක්) එහි අනුකලන මාර්ගය හරහා ලිහිල් හෝ පුළුල් පදනමකින් යුත් අනුකලනය වූ කලාපීය සංවිධාන වෙත ද එතැන් සිට ඉහළම තලයට විහිද යන විට එහිදී ජාත්‍යන්තර සංවිධාන සහ ජාත්‍යන්තර නීතිරීති (ජාත්‍යන්තර රාජ්‍යයන්) මගින් නිර්මාණය කෙරෙන්නේ අනිවාර්ය ගැටුම් ශිෂ්ට අන්දමින් නිරාකරණය කිරීම සඳහා ඔරොත්තු දෙන ආයතනික සහ නෛතික වශයෙන් ස්ථාපිත කරන ලද කොන්දේසි සහිත මූලික රාමුවකි. පාදක ව්‍යුහ තත්ත්වයන්හි කාර්යභාරය වන්නේ සෑම තලයකදීම ප්‍රචණ්ඩ ගැටුම්වලට එරෙහිව කටයුතු කිරීම සහ ඇත්ත වශයෙන්ම මූලධර්ම වශයෙන් එය මැඩපැවැත්වීමයි. කලකදී මෙය ඉසිවර මතය විය; අද මෙය උපයෝගික තථ්‍ය දේශපාලනයේ මූලික සංරචකයක් විය යුතුය.

## 10. ගෝලීය සාම පද්ධතියක් ප්‍රවර්ධනය සඳහා ක්‍රියාකාරකම්

ගෝලීය පාලනයක් නිර්මාණය කිරීම ඉලක්ක කරගත් මෙම තථ්‍ය දේශපාලන ව්‍යාපාරයට ආරම්භයක් සැපයීම කාගෙන් බලාපොරොත්තු විය හැකි ද? කලක දී අර්ථදායී සැලසුම්වලින් සන්නද්ධ සාමවාදීන් විශ්වාස කළේ ප්‍රධාන පෙළේ රාජ්‍යතාන්ත්‍රිකයන්ගේ දූරදර්ශී හැසිරීම්වල ප්‍රතිඵලයක් ලෙස නව ගෝලීය රටාවක් බිහි වන බවයි; වෙනත් වචනවලින් පවසන්නේ නම්, ජාත්‍යන්තරවාදී සහ විශ්ව සම්මතයන් පදනම් කරගත් දක්ෂ රාජ්‍යතාන්ත්‍රිකරණයෙන් සහ ජාත්‍යන්තර සංවිධානවල සහයෝගයෙන් මෙය සිදු වේ. රාජ්‍යයන් අතර, ගුණාත්මක වෙනස ඔවුන් පිළිගත් බැවින් නෛසර්ගික වශයෙන් රාජ්‍යය ගැන ඔවුන්ට ප්‍රශ්න නොතිබුණි. ඊටත් වඩා ඔවුන් 'චෞර රාජ්‍යය' යන යෙදුමේ අර්ථය ඒ වන විටත් වටහා ගෙන තිබුණි (ෆ්‍රයිඩ්, බෙන්ස් 1998 බලන්න). ජාත්‍යන්තර රටාව පිළිගැනීම තරයේ ප්‍රතික්ෂේප කරන ජාත්‍යන්තර ප්‍රජාව තුළ සිටින ක්‍රියාකාරක රාජ්‍ය මෙයින් හඳුනා ගනු ලැබීය. පවත්නා ආකල්ප සහ වර්තමාන තත්ත්වය නැවත විමසා බැලීමේ දී මෙම සාමවාදී දර්ශනය රාජ්‍යය සහ රාජ්‍යයේ ක්‍රියාකාරීන් මත බොහෝ සෙයින් රඳා පවතින බව පෙනෙයි. එසේ නමුත්, රාජ්‍ය ප්‍රජාව, ප්‍රජා සහ කාන්තා වැනි සමාජ ව්‍යාපාර හෝ සමාජවාදී සාම ව්‍යාපාර සහ ඒවායේ ජාත්‍යන්තර ජාලයන් ශිෂ්ට සම්පන්න කිරීමේ කාර්යය සඳහා ප්‍රයෝජනවත් බව සලකන ලදී. අරාජකත්ව චින්තනය මෙම මාදිලියේ සාමවාදයෙන් සපුරා පරිබාහිර වේ.

විවිධ ලක්ෂණයන් ගෙන් යුත් රාජ්‍ය පවත්නා බැව් පිළිගත යුතුය, මෙම කාරණය සුළු කොට තැකීම නිරර්ථක කාර්යයක් විය හැකිය. එයට හේතුව එය ගැටුම ශිෂ්ට සම්පන්න කිරීම සඳහා අවස්ථා විවෘත කර දීමයි. කෙසේ වුවද වර්තමාන ලෝකයේ ගැඹුරු සහ පුළුල් අන්තර්පරායත්තතා මගින් තේරුම් ගත යුත්තේ අඩුම වශයෙන් ආර්ථික සහයෝගතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය (OECD) තුළ රාජ්‍යයේ සහ රාජ්‍යත්වයේ විශේෂත්වය හීනවෙමින් පවතින බවයි. එවැනි අන්තර්-පරායත්තතා ආර්ථික සහ සංස්කෘතික ක්‍රියාකාරීන්ට පමණක් නොව විශේෂයෙන්ම සමාජමය ක්‍රියාකාරීන්ට ද ජාත්‍යන්තර දේශපාලනයේ කාර්ය භාරයක් ඉටු කිරීමට ඉඩ සලසයි (සෙම්පියල් 1993).



කලක් තිස්සේ නිරීක්ෂණයට ලක් කර තිබෙන පරිදි විදේශ ප්‍රතිපත්තියේ වඩ වඩා වැදගත් වන ආර්ථිකමය ස්වභාවයට සමගාමීව, අද විදේශ සම්බන්ධතා පවා 'සමාජයානුයෝගී' වෙමින් පවතී. මෙම තත්ත්වයම විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපෑමක් ඇති කරයිඃ මාධ්‍යය, ලාභාපේක්ෂක කණ්ඩායම්, පක්ෂ, දේශපාලන පදනම්, වෘත්තියවේදීන්ගේ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් සමාජයීය කණ්ඩායම් ජාතික මායිම් හරහා දැඩි ලෙස ජාලගත වී ඇත. මේවායින් සමහරක් දූනටමත් සැලකිය යුතු ආධිපත්‍යයක් ලබා ඇත (කැලිබ් 1998).

තවද, ආපදා සහ හදිසි අවස්ථා කළමනාකරණයේ දී, විශේෂයෙන්ම ජනවර්ගී-දේශපාලන ගැටුම්වලට ප්‍රතිචාර දැක්වීමේදී රාජ්‍ය නොවන සංවිධාන (NGO) තිබීම අද ලෝකයේ අත්‍යවශ්‍ය දෙයකි. සමාජමය වශයෙන් කැපවී සිටින පුරවැසියන් වෙනුවෙන්, සාම ප්‍රතිපත්ති ක්‍රියාකාරීත්වයේ නව්‍ය සහ විවිධත්වයෙන් යුත් ක්ෂේත්‍රයක් මතුවෙමින් පවතී. මෙම ක්ෂේත්‍රය සඳහා කාර්ය මණ්ඩල සහ නිපුණතා වශයෙන් විවිධ වූ ඉල්ලීම් පවතී. දේශපාලන හා සමාජයීය වශයෙන් වරප්‍රසාද අහිමි කණ්ඩායම්වලට සහාය වීම ('බලගැන්වීම') අනතුරට මුහුණපා සිටින්නන් ප්‍රවාහනය කිරීම, සරණාගතයින්ට උපකාරීවීම,

පශ්චාද්-ගැටුම් සාම ගොඩනැගීම, ගැටුම් ආරම්භ විය හැකි අවස්ථාවන් ගැන සහ උත්සන්නවීමට ඇති ලක්ෂණ වාර්තා කිරීම ('පූර්ව-අනතුරු ඇඟවීම්'), උද්ඝෝෂණ නිරීක්ෂණය කිරීම, සතුරු පාර්ශ්වයන් අතර සංවාද සංවිධාන කිරීම, මැදිහත්වීම් සහ ක්‍රියාවලි සහාය, අධිකරණ නිරීක්ෂකයන් සපයාදීම, පෙර ගැටුම් උණුසුම් තත්ත්වයන් ඇති විය හැකි සහ නියත වශයෙන් ම උණුසුම් තත්ත්වයන් පවතින ප්‍රදේශවල කායික වශයෙන් පෙනී සිටීම, මැතිවරණ නිරීක්ෂකයින් සපයාදීම සහ එක්සත් ජාතීන් (UN), යුරෝපයේ සුරක්ෂාව සහ සහයෝගය සඳහා වූ සංවිධානය (OSCE) සහ යුරෝපීය සංගමය (EU) ආදියේ නිල දූත මෙහෙවර සඳහා උපදෙස් දීම ආදිය ඒවායේ කාර්යභාරයයි (මර්කල්, 1998).

දීර්ඝකාලීන වශයෙන් ගත් කල මෙම ක්‍රියාකාරකම් තත්කාර්ය පදනමක් මත සංවිධානය නොකළ හැකිය; අවශ්‍ය කැපවීමට අමතරව ගැලපෙන පුහුණුවක් ද ඔවුන්ට අවශ්‍ය වේ. වෙනත් වචනවලින් පවසන්නේ නම්, අවශ්‍ය වන කරුණු වන්නේ, ගැටලුව සහ සන්දර්භය වශයෙන් විශේෂිත 'සිවිල් සාම සේවාවක්' හෝ ඇත්ත වශයෙන්ම විශේෂඥ සාම සේවාවක් වන අතර, එහි දී සිවිල් කැපවීම හා අදාළ නිපුණතා එකිනෙක ගැලපිය යුතුය. මෙය අර්ථදායී සාම වාදය සඳහා තවත් පුළුල් නව ක්‍රියාකාරීත්ව වපසරියක් විවෘත කරදෙයි. මේ සඳහා ප්‍රාරම්භක සහ අඛණ්ඩ පර්යේෂණය සහ ඇගැයීමකි. කෙසේ වුවද මෙහි වර්ධනය ආරම්භ වූයේ 1990 දශකයේ පටන් ය.

මෙම සාම ක්‍රියාකාරකම් සඳහා සංකල්ප වර්ධනය කිරීමේ අවශ්‍යතාව වැඩිවන්නේ සේවාවන් සඳහා ඒවායේ ඉල්ලුමත් සමගය. එකී ඉල්ලුම සැබෑ අවශ්‍යතා, විශේෂයෙන් මූලික අත්දැකීම් පිළිබිඹු කරයි. මෙම අත්දැකීම්, විශේෂයෙන්ම අර්බුද සහ ගැටුම් අවස්ථාවන්හි දී ලබාගත් අත්දැකීම් පෙන්නුම් කරන්නේ බොහෝ අවස්ථාවල දී රාජ්‍යයේ සහ සිවිල් සමාජයේ ක්‍රියාකාරීන් ක්‍රියාකරනු ලබන්නේ විවිධ තලවල සිට විවිධ ඉලක්ක කණ්ඩායම් සඳහා වුවත් ඔවුන් එකිනෙකා කෙරෙහි තබන විශ්වාසයයි (ලෙඩෙරාච් 1994). සන්නද්ධ ගැටුම්වලදී සිවිල් සමාජ ක්‍රියාකාරීන් විසින් කිසියම් ආකාරයක කාර්යභාරයක් ඉටු කිරීම සහතික වන පරිදි සමහර අවස්ථාවලදී මිලිටරි ආරක්ෂක ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය බව ඔප්පු විය හැකිය. මෙම සන්දර්භය තුළ අන්තර් නියෝජිතායතන සම්බන්ධය පිළිබඳ දැඩි අන්තවාදී බිය අයහපත් ප්‍රතිඵල ගෙන දිය හැකිය. එසේ වුවත් හවුල් ඉගෙනුම් ක්‍රියාවලි, එනම් 'බහු-පථ ක්‍රියාකාරකම්' ඔවුන්ට ම පෙන්වා දී ඇත්තේ ඉදිරිමග එය බවයි (රොපර්ස් 1997).



## 11. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම

Archibugi, Daniele, and David Held (eds.) 1995. *Cosmopolitan Democracy: An Agenda for a New World Order,* Cambridge: Polity Press.

Bauer, Andreas F. 1996. *Effektivität und Legitimität. Die Entwicklung der Friedenssicherung durch Zwang nach Kapitel VII der Charta der Vereinten Nationen unter besonderer Berücksichtigung der neueren Praxis des Sicherheitsrates*, Berlin: Duncker and Humblot.

Bedjaoui, Mohammed 1995. *The New World Order and the Security Council: Testing the Legality of its Acts* Dodrecht: Nijhoff.

Beisheim Marianne et al. 1999. *Im Zeitalter der Globalisierung? Thesen und Daten zur gesellschaftlichen und politischen Denationalisierung*, Baden-Baden: Nomos.

Benz, Wolfgang (ed.) 1988. *Pazifismus in Deutschland,* Frankfurt am Main: Fischer.
Bobbio, Norberto 1998. *Das Zeitalter der Menschenrechte. 1st Toleranz durchsetzbar?,* Berlin: Wagenbach.
Boulding, Kenneth 1978. *Stable Peace,* Austin: University of Texas Press.
Brieskorn, Norbert (ed.) 1997. *Globale Solidarität,* Stuttgart: Kohlhammer.
Calließ, Jörg (ed.) 1997. *Wodurch und wie konstituiert sich Frieden? Das zivilisatorische Hexagon auf dem Prüfstand,* Loccum: Ev. Akademie.
Calließ, Jörg (ed.) 1998. *Barfuß auf diplomatischem Parkett. Die Nichtregierungsorganisationen in der Weltpolitik,* Loccum: Ev. Akademie.
Czempiel, Ernst-Otto 1993. *Weltpolitik im Umbruch,* München: Beck.
Czempiel, Ernst-Otto 1998. *Friedensstrategien,* Opladen: Westdeutscher Verlag.
Dabag, Mihran and Kristin Platt (eds.) 1998. *Genozid und Moderne,* Bd. 1., Opladen: Leske & Budrich.
Deutsch, Karl W. et al. 1957. *Political Community and the North Atlantic Area: International Organization in the Light of Historical Experience,* Princeton: Princeton University Press.
Falk, Richard et al. (eds.) 1993. *The Constitutional Foundations of World Peace,* New York: State University of New York Press.
Falk, Richard 1995. *On Humane Governance: Toward a New Global Politics,* Oxford: Polity Press.
Ferencz, Benjamin B. 1994. N*ew Legal Foundations for Global Survival: Security Through the Security Council,* New York: Oceana.



Fried, Alfred H. 1918. *Problem der Friedenstechnik,* Leipzig: Verlag Naturwissenschaften.
Fukuyama, Francis 1992. *The End of History and the Last Man,* New York: The Free Press.
Gading, Heike 1996. *Der Schutz grundlegender Menschenrechte durch militärische Maßnahmen des Sicherheitsrates – das Ende staatlicher Souveränität?,* Berlin: Duncker & Humblot.
Gantzel, Klaus-Jürgen and Torsten Schwinghammer 1995. *Die Kriege nach dem Zweiten Weltkrieg 1945 bis 1992. Daten und Tendenzen,* Münster/Hamburg: Lit.
Habermas, Jürgen 1998. *Die postnationale Konstellation,* Frankfurt am Main: Suhrkamp.
Heinsohn, Gunnar 1998. *Lexikon der Völkermorde,* Reinbek bei Hamburg: Rowohlt.
Held, David 1995. *Democracy and the Global Order: From the Modern State to Cosmopolitan Governance,* Cambridge: Polity Press.
Höffe, Otfried 1999. *Demokratie im Zeitalter der Globalisierung,* München: Beck.
Krell, Gret and Harald Müller (eds.) 1994. *Frieden und Konflikt in den internationalen Beziehungen,* Frankfurt am Main: Campus.
Lailach, Martin 1998. *Die Wahrung des Weltfriedens und der internationalen Sicherheit als Aufgabe des Sicherheitsrates der Vereinten Nationen,* Berlin: Duncker & Humblot.
Lederach, John Paul 1994. *Building Peace: Sustainable Reconciliation in Divided Societies,* Washington: US Institute of Peace Press.
Martenczuk, Bernd 1996. *Rechtsbindung und Rechtskontrolle des Weltsicherheitsrates,* Berlin Duncke Humblot.

Merkel, Christine (ed.) 1998 *Friedenspolitik der Zivilgesellschaft,* Münster: Agenda.

Meyer, Berthol (ed.) 1996. *Eine Welt oder Chaos?,* Frankfurt am Main: Suhrkamp.

Rittberger, Volker 1994. *Internationale Organisationen. Politik und Geschichte,* Opladen: Leske & Budrich.

Ropers, Norbert 1997. *"Prävention und Friedenskonsolidierung als Aufgabe für gesellschaftlice Akteure",* in Senghaas, op. cit., 219-242.

Senghaas, Dieter 1992. *Friedensprojekt Europa*, Frankfurt am Main: Suhrkamp.

Senghaas, Dieter 1994a. *"Interdependenzen im internationalen System"*, in Krell and Müller (eds.), op. cit., 190-222.

Senghaas, Dieter 1994b. *Wohin driftet die Welt? Über die Zukunft friedlicher Koexistenz*, Frankfurt am Main: Suhrkamp.

Senghaas, Dieter (ed.) 1995. *Den Frieden denken,* Frankfurt am Main: Suhrkamp.

Senghaas, Dieter (ed.) 1997. *Frieden machen,* Frankfurt am Main: Suhrkamp.

Senghaas, Dieter (ed.) 1998. *Zivilisierung wider Willen. Der Konflikt der Kulturen mit sich selbs,* Frankfurt am Main: Suhrkamp.

Senghaas, Dieter 2001. *The Clash Within Civilizations: Coming to Terms with Cultural Conflicts,* London/New York: Routledge.

Senghaas, Dieter and Eva Senghaas 1996. "Si vis pacem, para pacem – Überlegungen zu einem zeitgemäßen Friedenskonzept", in Berthold Meyer, op. cit. 245–275.

Vogt, Wolfgang R. (ed.) 1996. *Frieden durch Zivilisierung? Probleme – Ansätze – Perspektiven,* Münster: Agenda.

Zielinski, Michael 1995. *Friedensursachen. Genese und konstituierende Bedingungen von Friedensgemeinschaften am Beispiel der Bundesrepublik Deutschland und der Entwicklungihrer Beziehungen zu den USA, Frankreich und den Niederlanden,* Baden-Baden: Nomos.

Zürn, Michael 1998. *Regieren jenseits des Nationalstaate,* Frankfurt am Main: Suhrkamp.

Zürn, Michael and Bernhard Zangl 1999. *"Weltpolizei oder Weltinterventionsgericht? Zur Zivilisierung der Konfliktbearbeitung",* Internationale Politik, 54:8, 17–2